**තංගල්ල නගර සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
-----------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 08 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 26 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට තංගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) හිඟ වැටුප් ගෙවීම් රු. 392,601 ක් ණයහිමි ගිණුමට ගලපනවා වෙනුවට, සමුච්චිත අරමුදල් හා ඌණතා ගිණුමට ගලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ සේවක ණය ශේෂය රු. 9,015 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති කිලෝග්‍රෑම් 2865 ක් වූ කොම්පෝස්ට් පොහොර තොගයේ වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
-------------------------

සේවක ඇප ආයෝජන ගිණුමේ හා සේවක ඇප තැන්පත් ගිණුමේ ශේෂ අතර රු. 13,645 ක වෙනසක් පැවතුණි.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ගිණුම්

දීර්ඝ කාලයක සිට සභාවට අයවිය යුතුව පවතින සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු. 2,564,818 ක හිඟ තානායම් කුලී අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

2014 වර්ෂයට අදාළ රු. 269,355 ක් වූ හිඟ වැටුප් මුදල් ගෙවා ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් එකතුව රු. 3,231,309 ක නඩු පවරන ලද ආදායම් සඳහා කාල විශ්ලේෂණ, ජර්නල් සටහන් මගින් ලියාහැර තිබූ එකතුව රු. 1,030,470 ක තැන්පතු ශේෂ සහ එකතුව රු. 342,560 ක් වූ තොග ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) නගර සභා ආඥා පනත (255 වන අධිකාරය) | |
| 180 (1) වගන්තිය | එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසුව සභා අරමුදලට ලැබුණු සහ වියදම් වුණු මුදල් වල ස්වභාවය සහ ප්‍රමාණයද සමඟ වර්ෂය තුළ සභාවේ පරිපාලනය පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මුදල් රෙගුලාසි 210 (1) | වට්ටම් ලබා ගත හැකි සෑම අවස්ථාවකදීම එම වට්ටම් ලබා ගැනීමට හැකි වනු පිණිස කල් ඇතිව ගෙවීම් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 385,785 ක ජල ගාස්තු ගෙවීමේදී වට්ටම් වාසි ලබා ගෙන නොතිබුණි. |

ii. මුදල් රෙගුලාසි 571(3) — 2004 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අයත් එකතුව රු. 1,186,047 ක් වූ තැන්පත් ශේෂ 549 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 10,419,278 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 1,253,326 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 9,165,952 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 88 ක් තරම් මුළු පුනරාවර්තන වියදම් පැවතීමෙන් ආදායමට සාපේක්ෂව වියදම් ඉතා ඉහල අගයක් ගෙන තිබුණි.

(ආ) සෑම වර්ෂයකම ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා පුනරාවර්තන වියදම් දැරීම සැලකිය යුතු අගයන්ගෙන් අඛණ්ඩව වැඩි වී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී එම අගය ස්වයං උත්පාදන ආදායම මෙන් තුන් ගුණයක් ඉක්මවා තිබුණි.

(ඇ) ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් කිසිඳු ආකාරයකින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගතවී තිබුණද වියදම් පාලනය කර ගැනීම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

------------------------------------

සමාලෝචිත වර්ෂයේදී ද ජංගම හා ක්ෂණික අනුපාතයන් සම්මත මට්ටම කරා ළඟාවී නොමැති බව නිරීක්ෂණය විය.

**2.4 ආදායම් පරිපාලනය**

**----------------------**

**2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**-------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය පිළිබඳ පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ ආදායම රු. 23,013,122 ක් වූ අතර, ඉන් රු. 17,304,170 ක් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 75 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතු ආදායම් ශේෂවල එකතුව රු. 9,762,052 ක් වූ අතර ඉන් රු. 3,406,309 ක් අයවී තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සියයට 35 ක් විය

**2.4.2 වරිපනම් බදු**

**--------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආරම්භක හිඟයෙන් සියයට 66 ක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබූ අතර, වර්ෂය අවසානයට හිඟ ශේෂය රු. 966,145 ක් විය. ඊට රු. 2,000 කට වැඩි හිඟ ශේෂ සහිත බදු ඒකක 51 කින් අයවිය යුතු මුදල රු. 330,190 ක් විය. නගර සභා ආඥාපනතේ 170 (අ) ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 1999 වර්ෂයේ වරිපනම් බදු තක්සේරුව මත සමාලෝචිත වර්ෂය දක්වාම බදු අයකර තිබූ අතර, නව තක්සේරු වාර්තා 2016 ජුනි 20 දින සභාවට භාරදී තිබුණු නමුත් එම නිර්දේශ 2017 ජූලි 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.4.3 බදු කුලී**

**--------**

නගර සභාවට අයත් තංගල්ල තානායම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට අනුබද්ධිත ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් ආයතනයෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු. 2,564,818 ක මුදලක් අයවීමට තිබුණු අතර, එම මුදල් අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170 (අ) වගන්තිය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

**2.4.4 කඩ කාමර කුලී**

**----------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිවිසුම් යාවත්කාලීන නොකිරීම

----------------------------------

i. 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 ඡේදය අනුව, සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවත්, කඩ කාමර 44 ක ගිවිසුම් වසර 06 සිට වසර 31 දක්වා කාල පරිච්ඡේදයක් තිස්සේ යාවත්කාලීන කර නොතිබුණි.

ii. යොමුගත චක්‍රලේඛයේ 06 වන ඡේදයට අනුව කඩ කාමර වසර 05 කට වරක්වත් තක්සේරු කර බදු කුලිය සංශෝධනය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එකී උපදෙස් අනුව කටයුතු කර නොතිබුණි. 2016 පෙබරවාරි 23 දින කල තක්සේරුව ක්‍රියාත්මක නොකර, 2002 සහ 2011 වසර වල ගත් සභා තීරණ මත පදනම්ව කුලී අයකර තිබුණි. එම හේතුව නිසා 2016 මාර්තු සිට දෙසැම්බර් දක්වා කාලය වෙනුවෙන් සභා අරමුදලට රු. 2,931,625 ක ආදායම් අහිමි වී තිබුණි.

(ආ) ජයසිංහවත්ත කඩ කාමර

----------------------------

i. නාගරික සංවර්ධන අධිකාරිය විසින් නගර සභාවට අයත් ජයසිංහවත්තෙහි ඉදිකරනු ලබන කඩ කාමර වර්ෂ 08 කට පමණ පෙර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණද, 2017 ජූලි 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. එසේ වුවද 2009 ජුනි 25 දින කඩ කාමර 16 ක් සඳහා හා 2011 ජනවාරි 06 දින කඩ කාමර 11 ක් සඳහා බදුකරුවන් සමඟ ගිවිසුම්ගත වී තිබුණි.

ii. පොදු වෙළඳපොළෙහි පිහිටි සභාව සතු කඩ කාමර කඩා ඉවත් කිරීමේ පදනම මත එහි බදුකරුවන් 15 දෙනෙකුට ජයසිංහවත්තෙහි පිහිටි කඩකාමර 15 ක් ලබා දීමට 2009 වර්ෂයේදී ගිවිසුම්ගතව තිබුණද, පොදු වෙළඳපොළෙහි කඩ කාමර කඩා ඉවත් කිරීමට 2017 ජුනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) හිඟ කඩ කාමර කුලී

-----------------------

තංගල්ල බස් නැවතුම්පොළෙහි පිහිටි කඩ කාමර 14 කින් වසර 01 සිට 07 දක්වා කාල පරාසයක් තිස්සේ කුලී මුදල් අයවී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු හිඟ මුදල රු. 171,181 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කාර්යසාධන ඇගයීම**

**-----------------------**

(අ) කාණු අළුත්වැඩියාව හා නඩත්තුව ඇතුළු කාර්යයන් 46 ක් සඳහා වාර්ෂික අයවැය ලේඛනය මගින් සලසා තිබූ එකතුව රු. 5,446,200 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ආ) මැසි මදුරු සණත්වය අවම කර ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීමේ ව්‍යාපෘතිය සඳහා සලසා තිබූ රු. 100,000 ක මුළු ප්‍රතිපාදනයම වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

**3.2 කළමණාකරණ අකාර්යක්ෂමතා**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉන්ධන දහනය පරීක්ෂා කිරීම.

1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේදය අනුව සභාව සතු වාහන 18 න් 11 ක ඉන්ධන දහනය සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂා කර නොතිබුණි.

(ආ) සභාවේ ගිනි හා ආපදා කළමණාකරණ ඒකකයේ වාහන දෙකක උපකරණ කට්ටල දෙකක් අවසන් වරට සිටි සභාපතිවරයා විසින් රැගෙන ගොස් තිබූ බව 2015 ජූලි 07 දින සිදුකළ පරීක්ෂාවේදී අනාවරණය වී තිබුණි. මෙම උපකරණ කට්ටල රැගෙන ගොස් වසර 02 කට අධික කාලයක් ගත වී ඇතත් 2017 ජූලි 10 දින වන විටත් නැවත සභාවට භාරදී නොතිබුණි.

**3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියක් පවත්වා තිබුණු නමුත් 2017 ජුනි 30 දක්වා පරිසර බලපත්‍රය හෝ පාරිසරික නිර්දේශ ලබා ගෙන නොතිබුණි.

(ආ) කසල බදු පනවා වියදම් ආවරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 කාර්ය මණ්ඩල කළමනාකරණය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 06 ක 27 දෙනෙකුගේ අතිරික්තයක් සහ තනතුරු 16 ක 25 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට මෙන්ම පුරප්පාඩු පුරවා ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**4.1 අයවැය පාලනය**

ආදායම් විෂයයන් 05 ක ළඟා කර නොගත් ඉලක්කයන්ගේ එකතුව රු. 28,438,804 ක් වූ අතර, එය සියයට 10 සිට සියයට 80 ක් දක්වා පරාසයක වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5 පද්ධති හා පාලන**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය